# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2019 ඔක්තෝබර් මස 25 වන දින

## II වන කොටස

## අතිරේකය

(2019.10.31 දින නිකුත් කරන ලදී)

# ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන)

**1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

මුදල් අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 17.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනතේ 2 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ-

(අ) බුකීකරුවකුගේ ව්‍යාපාරයක හෝ සූදු ව්‍යාපාරයක දළ එකතුව මත වන බද්ද සියයට පහළොවක් දක්වා වැඩි කිරීම;

(ආ) සූදු ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන ස්ථානයකට ඇතුල්වන යම් ශ්‍රී ලාංකික පුරවැසියකුගෙන් කැසිනෝ ඇතුල්වීමේ බද්ද අයකර ගනු ලැබීම සඳහා විධිවිධාන සැලසීම;

(ඇ) කැසිනෝ ඇතුල්වීමේ බද්ද ගෙවීම සහ අයකර ගැනීම සඳහා වන ආකාරය සහ කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම,

වේ.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ-

(අ) දළ එකතුව මත වන බද්ද සහ කැසිනෝ ඇතුල්වීමේ බද්ද සම්බන්ධයෙන් එම වගන්තියේ (2) වන, (3) වන සහ (4) වන උපවගන්තිවල අදාළ වීම දීර්ඝ කිරීම;

(ආ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ ඇතැම් විධිවිධාන ප්‍රධාන ප්‍රඥප්තියට අදාළ වීම දක්වා දීර්ඝ කිරීම.

***4 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ප්‍රධාන ප්‍රඥප්තියේ 4(5) වන වගන්තියේ විධිවිධාන සමඟ 1981 අංක 69 දරන ව්‍යාපාර පිරිවැටුම් බදු පනතේ ඇතැම් විධිවිධාන අදාළ වීම සඳහා විධිවිධාන සැලසීම වේ.

***5 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින්, "ශ්‍රී ලාංකික පුරවැසියා" යන යෙදුම සඳහා අලුත් අර්ථ නිරූපණයක් ඇතුළත් කිරීම මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***6 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින්, 2019 ඔක්තෝබර් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම අය කරනු ලැබිය යුතු බදුවලට අදාළ මුදල් ප්‍රමාණයන් ඇතුළත් කිරීම මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනයේ II වන කොටස සංශෝධනය කරනු ලැබේ.

# ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු
## (සංශෝධන)

එල්.ඩී.–ඕ. 10/2019

**1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

**1.** මේ පනත 2019 අංක දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය.

**2.** 2015 අංක 14 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

1988 අංක 40 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1අ) වන උපවගන්තියේ (අ) ඡේදයේ "සියයට පහක අනුපාතයකට අනුව වූ; හෝ" යන වචන වෙනුවට "සියයට පහක අනුපාතය අනුව වූ;" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (1අ) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "2015 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම සියයට දහයක අනුපාතයකට අනුව වූ,"යන වචන සහ ඉලක්කම් වෙනුවට "2015 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව, එහෙත් 2019 ඔක්තෝබර් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම සියයට දහයක අනුපාතයකට අනුව වූ; හෝ " යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(3) එම වගන්තියේ (1අ) වන උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(ඇ) 2019 ඔක්තෝබර් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම සියයට පහළොවක අනුපාතයකට අනුව වූ,";

(4) එම වගන්තියේ (1අඅ) වන උපවගන්තියේ "2015 ජනවාරි මස" යන වචන සහ ඉලක්කම්වල සිට "බද්දක් අය කරගනු ලැබිය යුතු යː" යන වචන දක්වා වන වචන සහ ඉලක්කම් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්:-

"(1අඅ) ශ්‍රී ලංකාවේ සූදු ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන සෑම තැනැත්තකු විසින් ම, (මෙහි මින්මතු "කැසිනෝ ඇතුල්වීමේ බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) බද්දක් :-

(අ) එම සූදු ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන ස්ථානයට ඇතුල්වන සෑම තැනැත්තකුගෙන් ම, එක්සත් ජනපද ඩොලර් සියයක හෝ පරිවර්තනය කළ හැකි ඊට සමාන වෙනත් ව්‍යවහාර මුදලකින් හෝ ඊට සමාන ශ්‍රී ලංකා රුපියල්වලින්, 2015 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන එහෙත් 2019 ඔක්තෝබර් මස 1 වන දිනට පෙර අවසන් වන;

(ආ) එම සූදු ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන ස්ථානයට ඇතුල්වන සෑම ශ්‍රී ලංකාවේ පුරවැසියකුගෙන්ම එක්සත් ජනපද ඩොලර් පනහක් හෝ පරිවර්තනය කළ හැකි ඊට සමාන වෙනත් ව්‍යවහාර මුදලකින් හෝ ඊට සමාන ශ්‍රී ලංකා රුපියල්වලින්, 2019 ඔක්තෝබර් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන,

යම් අදාළ කාර්තුවක් සඳහා, අය කරගනු ලැබිය යුතු අතර, එසේ අයකර ගන්නා ලද කැසිනෝ ඇතුල්වීමේ බද්ද මේ වගන්තියේ (1ආ) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධානවලට අනුකූලව කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවනු ලැබිය යුතු ය.".

(5) එම වගන්තියේ (1ආ) වන උපවගන්තියේ :-

(අ) "(1අ) වන උපවගන්තිය සහ (1අඅ) වන උපවගන්තිය යටතේ බද්ද ගෙවීමට යටත් සෑම තැනැත්තකු විසින්ම" යන වචන වෙනුවට "(1අ) වන උපවගන්තිය යටතේ බද්ද ගෙවීමට යටත් සෑම තැනැත්තකුම සහ (1අඅ) වන උපවගන්තිය යටතේ බද්ද අය කරගෙන ගෙවීමට යටත් වන සෑම තැනැත්තකු විසින් ම" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) එම උපවගන්තියේ (ආ) ඡේදයේ "ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට "කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවනු ලැබිය යුතු ය."යන වචන ආදේශ කිරීමෙන්;

(6) එම වගන්තියේ (1ඇ) වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(1ඇ) (අ) මේ වගන්තියේ (1) වන, (1අ) වන උපවගන්තිවල දක්වා ඇති බදු ගෙවීමට සහ මේ වගන්තියේ (1අඅ) වන උපවගන්තියේ දක්වා ඇති කැසිනෝ ඇතුල්වීමේ බද්ද අය කරගෙන ගෙවීමට යටත් යම් තැනැත්තකු, අවස්ථාවෝචිත පරිදි, එම බදු ගෙවීම හෝ අයකර ගැනීම පැහැර හරින අවස්ථාවක, එම පැහැර හැරීම සම්බන්ධයෙන් අදාළ පරිදි, 4 වන වගන්තියේ (2), (3), (4), (5), (5අ) සහ (6) වන උපවගන්තිවල විධිවිධාන අදාළ විය යුතු ය.

(ආ) (1අඅ) වන උපවගන්තිය යටතේ වන බද්ද අයකර ගැනීමට සහ ගෙවීමට අදාළ ආකාරය සහ කාර්ය පටිපාටිය අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :-

"(2) 2 වන වගන්තියේ (1) වන, (1අ) වන උපවගන්තිවල සඳහන් බදු ගෙවීමට සහ (1අඅ) වන උපවගන්තියේ සඳහන් කැසිනෝ ඇතුල්වීමේ බද්ද අය කරගෙන ගෙවීමට යටත් යම් තැනැත්තකු,-

(අ) මේ පනතේ නිශ්චිතව සඳහන් දිනවල දී හෝ ඉන් පෙර, පිළිවෙළින් එම වගන්තියේ (1) වන, (1අ) වන සහ (1අඅ) වන උපවගන්තිවල සඳහන් බද්දේ යම් වාරිකයක් හෝ ඉන් කොටසක් හෝ දළ එකතුව මත වන බද්ද හෝ ඉන් කොටසක් ගෙවීම හෝ කැසිනෝ ඇතුල්වීමේ බද්ද අයකර ගෙන ගෙවීමට; හෝ

(ආ) යම් කාලසීමාවක් සඳහා සහකාර කොමසාරිස්වරයකු විසින් තක්සේරු කරනු ලැබුවා වූද, එම තක්සේරු දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයේ දී හෝ ඉන් පෙර ගෙවිය යුතු වන්නා වූද, එම වගන්තියේ (1අ) වන උපවගන්තියේ දක්වා ඇති දළ එකතුව මත වන බද්ද හෝ ඉන් යම් කොටසක් ගෙවීම,

පැහැර හරින අවස්ථාවක දී, එම බද්දේ වාරිකය හෝ ඉන් කොටසක් හෝ දළ එකතුව මත වන බද්ද හෝ ඉන් කොටසක් හෝ කැසිනෝ ඇතුල්වීමේ බද්ද, පැහැර හැර ඇති බද්දක් ලෙස සලකනු ලැබිය යුතු අතර, මේ පනතේ කාර්යය සඳහා එම තැනැත්තන් ගෙවීම පැහැර හැර ඇති තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතු ය.";

(2) එම වගන්තියේ (3) වන උපවගන්තියේ:-

(අ) "බද්දේ යම් වාරිකයක් ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක-" යන වචන වෙනුවට "පිළිවෙළින්, 2 වන වගන්තියේ (1), (1අ) සහ (1අඅ) වන උපවගන්තිවල දක්වා ඇති බද්දේ යම් වාරිකයක් හෝ ඉන් කොටසක් හෝ දළ එකතුව මත වන බද්ද හෝ ඉන් කොටසක් හෝ කැසිනෝ ඇතුල්වීමේ බද්ද ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක -" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) එම උපවගන්තියේ (අ) ඡේදයේ "ඒ පැහැර හැරීම 1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඒ දිනයෙන් පසුව එහෙත් 2001 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් වර්ෂයක දී ගෙවිය යුතු වාරිකයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක," යන වචන වෙනුවට "ඒ පැහැර හැරීම 1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඒ දිනයෙන් පසුව එහෙත් 2001 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් වර්ෂයක දී ගෙවිය යුතු 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වන බද්දේ යම් වාරිකයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක" යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) එම උපවගන්තියේ (ආ) ඡේදයේ "පැහැර හැරීම, 2001 අප්‍රේල් මස 1 වන දිනයේ දී හෝ ඉන් පසුව ආරම්භ වන යම් වර්ෂයක දී ගෙවිය යුතු වාරිකයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී" යන වචන වෙනුවට, "පැහැර හැරීම, 2001 අප්‍රේල් මස 1 වන දිනයේ දී හෝ ඉන් පසුව ආරම්භ වන යම් වර්ෂයක දී ගෙවිය යුතු 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වන බද්දේ යම් වාරිකයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී" යන වචන ආදේශ කිරීමෙන්;

(3) එම වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) ඡේදයේ අතුරු විධානයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :-

"(ඇ) එම පැහැර හැරීම 2 වන වගන්තියේ (1අ) සහ (1අඅ) වන උපවගන්ති යටතේ ගෙවිය යුතු බදු සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, එසේ පැහැර හැර ඇති බද්දට අමතරව-

(i) එම බද්දෙන් සියයට දහයකට සමාන මුදලක දණ්ඩනයක් ; සහ

(ii) එම බද්ද පැහැර හැර ඇති බද්දක් බවට පත්වීම ආරම්භ වූ අවස්ථාවේ සිට දින තිහක් ඉකුත්වීමට පෙර එම බද්ද නොගෙවනු ලැබ ඇති අවස්ථාවක දී, එම බද්ද පැහැර හැරීම සිදුකරගෙන යන එක් එක් වැඩිදුරටත් වූ දින තිහක කාලසීමාවක් හෝ ඉන් කොටසක් සම්බන්ධයෙන් පැහැර හරින ලද බද්දෙන් සියයට දහයකට සමාන මුදලක වැඩි දුරටත් වූ දණ්ඩනයක්,

පැහැර හරින ලද තැනැත්තා විසින් ගෙවිය යුතු යඃ

එසේ වුවද, කිසිදු අවස්ථාවක දී මේ ඡේදය යටතේ දණ්ඩනය වශයෙන් ගෙවිය යුතු මුළු මුදල, පැහැර හැර ඇති බද්දෙන් සියයට පනහක් නොඉක්මවිය යුතු ය.";

(4) එම වගන්තියේ (4) වන උපවගන්තියේ "පැහැර හැර ඇති යම් වාරිකයක්" යන වචන වෙනුවට "2 වන වගන්තියේ පිළිවෙළින් (1), (1අ) සහ (1අඅ) වන උපවගන්තිවල දක්වා ඇති, අවස්ථාවෝචිත පරිදි, පැහැර හැර ඇති බද්දේ යම් වාරිකයක් හෝ ඉන් කොටසක් හෝ දළ එකතුව මත වන බද්ද හෝ ඉන් කොටසක් හෝ කැසිනෝ ඇතුල්වීමේ බද්ද"යන වචන ආදේශ කිරීමෙන්;

(5) 2015 අංක 14 දරන ඔට්ටු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන) පනත මගින් ඇතුළත් කරන ලද (6) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්;

(6) එම වගන්තියේ (5) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :-

"(5අ) මේ වගන්තියේ (5) වන උපවගන්තියේ විධිවිධානවලට අතිරේකව, 2018 අප්‍රේල් මස 1 වන දින සිට හෝ ඉන්පසු ආරම්භ වන අදාළ තක්සේරු වර්ෂය සඳහා පිළිවෙලින් පරිපාලන විධිවිධාන, වාර්තා තබා ගැනීම සහ තොරතුරු රැස් කිරීම, තක්සේරු කිරීම, විරෝධතා සහ අභියාචනා, බදු සඳහා බැඳීම සහ බදු ගෙවීම, පොලිය, බදු අයකර ගැනීම, දණ්ඩන, අපරාධ නඩු කටයුතු, නියෝග සහ අර්ථ නිරූපණයට අදාළ 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ IX, X, XII, XIII, XIV, XV, XVI, XVII, XVIII, XIX සහ XX වන පරිච්ඡේදවල විධිවිධාන පිළිවෙළින් මෙම පනත යටතේ වන පරිපාලන විධිවිධාන, වාර්තා තබා ගැනීම සහ තොරතුරු රැස් කිරීම, තක්සේරු කිරීම, විරෝධතා සහ අභියාචන, බදු සඳහා බැඳීම සහ බදු ගෙවීම, පොලිය, බදු අයකර ගැනීම, දණ්ඩන, අපරාධ නඩු කටයුතු, නියෝග සහ අර්ථ නිරූපණ සම්බන්ධයෙන්, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම උපවගන්තියේ (අ) ඡේදයේ "දේශීය ආදායම් බදු පනතේ 190 වන වගන්තිය" යන වචන සහ ඉලක්කම වෙනුවට "ව්‍යාපාර පිරිවැටුම් බදු පනතේ 38 වන වගන්තිය" යන වචන සහ ඉලක්කම ආදේශ කිරීමෙන්;

(2) එම උපවගන්තියේ (ආ) ඡේදයේ "දේශීය ආදායම් බදු පනතේ 214 වන හෝ 215 වන වගන්ති" යන වචන සහ ඉලක්කම් වෙනුවට "ව්‍යාපාර පිරිවැටුම් බදු පනතේ 42 වන වගන්තිය හෝ 43 වන වගන්තිය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(3) එම උපවගන්තියේ (ඇ ) ඡේදයේ "දේශීය ආදායම් බදු පනතේ 209 වන වගන්තිය" යන වචන සහ ඉලක්කම වෙනුවට"ව්‍යාපාර පිරිවැටුම් බදු පනතේ 57 වන වගන්තිය" යන වචන සහ ඉලක්කම ආදේශ කිරීමෙන්;

(4) එම උපවගන්තියේ (ඉ) ඡේදයේ "දේශීය ආදායම් බදු පනතේ 209 වන වගන්තිය" යන වචන සහ ඉලක්කම වෙනුවට "ව්‍යාපාර පිරිවැටුම් බදු පනතේ 57 වන වගන්තිය" යන වචන සහ ඉලක්කම ආදේශ කිරීමෙන්.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ "කොමසාරිස්-ජනරාල්වරයා" සහ "නියෝජ්‍ය කොමසාරිස්" යන යෙදුම්වල අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

"ශ්‍රී ලංකාවේ පුරවැසියා" යන්නෙන්, (349 වන අධිකාරය වූ) පුරවැසි පනත යටතේ ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය සතු තැනැත්තකු අදහස් වේ;

**6.** 2015 අංක 14 දරන පනත මඟින් අවසන් වරට සංශෝධිත පරිදි වූ ඔට්ටු ඇල්ලීම හා සූදු බදු පනතේ උපලේඛනය, එහි II වන කොටස ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය සංශෝධනය කිරීම.

"II වන කොටස

සූදූ ව්‍යාපාරයක් කරගෙන යනු ලබන තැනැත්තකු විසින්, මෙහි I වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති සෑම වර්ෂයක් සඳහා ම ගෙවිය යුතු බදු මුදල් ප්‍රමාණය මෙහි II වන තීරුවේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති මුදල හා සමාන මුදලක් විය යුතු ය.

| I වන තීරුව<br>*වර්ෂය* | II වන තීරුව<br>*බදු මුදල් ප්‍රමාණය* |
|---|---|
| 1. 1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2001 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම. | රුපියල් මිලියන එකක් |
| 2. 2001 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2002 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම. | රුපියල් මිලියන විසි පහක් |

| I වන තීරුව *වර්ෂය* | II වන තීරුව *බදු මුදල් ප්‍රමාණය* |
|---|---|
| 3. 2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2005 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම- | |
| (i) (රූජිනෝ ක්‍රීඩාව කිරීම හැර) සූදු ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා. | රුපියල් මිලියන දොළහක් |
| (ii) රූජිනෝ ක්‍රීඩාව පමණක් ක්‍රීඩා කිරීමෙන් ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා. | රුපියල් ලක්ෂ පහක් |
| 4. 2005 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2013 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම රූජිනෝ ක්‍රීඩාව ක්‍රීඩා කිරීම ඇතුළු සූදු ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා. | රුපියල් මිලියන පනහක් |
| 5. 2013 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2015 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම රූජිනෝ ක්‍රීඩාව ක්‍රීඩා කිරීම ඇතුළු සූදු ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා. | රුපියල් මිලියන සියයක් |
| 6. 2015 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 2019 ඔක්තෝබර් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම රූජිනෝ ක්‍රීඩාව ක්‍රීඩා කිරීම ඇතුළු සූදු ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා. | රුපියල් මිලියන දෙසීයයක් |

| I වන තීරුව<br>*වර්ෂය* | II වන තීරුව<br>*බදු මුදල් ප්‍රමාණය* |
| --- | --- |
| 7. 2019 ඔක්තෝබර් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම- | |
| (i) (රුජිනෝ ක්‍රීඩාව කිරීම පමණක් ක්‍රීඩා කිරීමෙන් ව්‍යාපාරය පවත්වාගෙන යාම හැර) සූදු ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා. | රුපියල් මිලියන හාරසියයක් |
| (ii) රුජිනෝ ක්‍රීඩාව පමණක් ක්‍රීඩා කිරීමෙන් ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා.”. | රුපියල් මිලියන එකක් |

අනනුකූලතාවක් ඇතිවූ විට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**7.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.